# මනස පිළිබඳ ප්‍රවාදයක්

මනස හැරෙන්නට අනෙක් ඉන්ද්‍රිය ක්‍රියාත්මකවීම සඳහා යම් අවයවයක් හා මනස අවශ්‍ය වෙයි. හම හා මනස එකතුවෙන් ස්පර්ශේන්ද්‍රිය ඇතිවෙයි. මනසක් නැතිව හම පමණක් තිබූ පමණින් ස්පර්ශේන්ද්‍රියක් නොවන බව අපද දුටුවෙමු. අපට ලැබෙන දැනුම් සියල්ල මනසෙන් ලබාගන්නා දැනුම් ය. මනසක් නැතිව දැනුමක් ඇති නො වෙයි. මනසින් තොරව ලොවක්, එනම් ඊනියා ද්‍රව්‍යවාදී ලොවක් ඇති බව පවසන්නේ ද මනස ඇසුරෙන් මිස මනස නැතිව නො වෙයි. මනසින් තොරව පවතින ඊනියා වාස්තවිකත්වයක් ගැන කිසිවකුටවත් මනසින් තොරව කතාකළ නො හැකි ය. ඊනියා වාස්තවිකත්වයක් ඇතැයි පවසන ද්‍රව්‍යවාදීන්ට අප අභියෝගකරන්නේ හැකදනම් මනසින් තොරව ලොවක් ඇති බව මනසින් තොරව පෙන්වන ලෙස ය.

අපට ලැබෙන සෘජු දැනුම මනස පිළිබඳ දැනුම ය. මනස ගැන වෙනත් කිසිම ඉන්ද්‍රියකින් තොරව මනසින් දැනගත හැකි ය. එහෙත් අප ඉදිරියේ මේසයක් ඇති බව අප දැනගන්නේ ඒ දැක බලා ය. නැතහොත් ඒ ස්පර්ශකිරීමෙන් ය. නැත්නම් දැක බලා හා ස්පර්ශකිරීමෙන් ය. එහෙත් ඒ සෑම විටකම මනස හවුල් වෙයි. මනස හා සම්බන්ධ වූ අවයවයක් නොතිබෙන්නට හැකි ය. එහෙත් මනසක් නැතැයි ඉන් නො කියැවෙයි.

එසේ නම් මේ සියල්ලෙන් කියැවෙන්නේ මනසක් ඇති බව ද? මනස ද අනෙක් සෑම දෙයක් මෙන් ම මනසේ නිර්මානයකි. අප දැන් සූදානම් වන්නේ මනස නිර්මානය කෙරෙන්නේ, එනම් මනස විසින් මනස නිර්මානය කෙරෙන්නේ කෙසේ ද යන්න විස්තර කිරීම ය. පහත සඳහන් කරුණු මෙයට කලින් දිවයින පුවත්පතෙහි පළ වූ සිංහල බෞද්ධ මනස නම් ලිපියෙහි සඳහන්වන බව සැලකිය යුතු ය.

සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ මනස යනුවෙන් ආකෘතියක් නිර්මාණය කිරීම මෙහි අරමුණ වෙයි. එය මනසෙහි ආකෘතියක් නොවන බව පළමුවෙන් ම සඳහන් කළ යුතු ය. යමක ආකෘතියක් නිර්මාණය කිරීමට නම් යමක් තිබෙන බව පිළිගත යුතු ය. නැත්නම් අඩුම තරමින් ඒ බව උපකල්පනය කළ යුතු ය. යමක් තිබෙන බව පිළිගැනීම ම ආත්මවාදී වෙයි. සිංහල බෞද්ධයෝ ආත්මවාදීහු නොවෙති. ආත්මවාදීන් නොවූව ද යම් යම් දෑ සම්මුති වශයෙන් තිබෙන බව සිංහල බෞද්ධයෝ පිළිගනිති. සම්මුති වශයෙන් මනසක් ඇති බව සිංහල බෞද්ධයනට පිළිගත හැකි ය. මෙහි දී සම්මුති මනස ඇති වන්නේ කෙසේ දැයි තේරුම් ගැනීමට උත්සාහයක් දැරෙයි.

භාරතීය බෞද්ධයනට මුහුණ පෑමට සිදු වූ ප්‍රධාන ම ප්‍රශ්නයක් වූයේ ආත්මයක් නැත්නම් කර්ම විපාක ඇති වන්නේ කාහට ද, කෙලෙස ද යන්න ය. පරලොව යන සත්වයකු, පුද්ගලයකු, විඥානයක් හෝ වෙනත් යමකු හෝ යමක් හෝ නොමැති නම් කර්ම ඵලය පිළිබඳ ප්‍රශ්නයක් ඇති වන බව ආත්මවාදී බමුණෝ පෙන්වා දුන්හ. ආලය විඥානය ආදී මහායානික ආත්මවාදී සංකල්ප ගොඩ නැගුනේ මේ අභියෝගයට මුහුණ දීමට යැමේ දී ය. ථෙරවාදීහු මේ ප්‍රශ්නයට පරලොව යන්නේ තමාත් නොව අන් අයකුත් නොවේ ය යන මිලින්ද ප්‍රශ්නයෙහි දැක්වෙන පිළිතුර කියා සෑහීමකට පත්වෙති. ඒ පිළිතුර සතුටුදායක වුවත්, ආත්මවාදයට හසු නොවූවත්, ඒ ප්‍රමාණවත් නොවේ. ප්‍රමාණවත් නොවන පිළිතුරු යම් යම් අවශ්‍යතා යටතේ සතුටුදායක විය හැකි ය.

පරලොව සම්බන්ධයෙන් පමණක් නොව, මෙලොව සම්බන්ධයෙන් ද, ආත්මවාදී නොවන්නනට මුහුණ පෑමට සිදුවන ගැටළු ඇත. පුද්ගලයකු නැතැයි කියන්නේ නම් කුඩා කල සිට තරුණ විය හෝ මහළු විය හෝ කිනම් වියක් හෝ දක්වා ජීවත්වන අනන්‍යතාවයක් සහිත පුද්ගලයන්ගේ පැවැත්ම තේරුම් ගන්නේ කෙසේ ද? පුද්ගලයකුට මතකයක් ඇත්තේ කෙසේ ද? මෙහි පුද්ගලයා යන්න යෙදෙන්නේ සම්මුති අර්ථයකින් බව අවධාරණය කළ යුතු ය. පුද්ගලයා යන්න පමණක් නොව සියළු සංකල්ප යොදා ගැනෙන්නේ සම්මුති අර්ථයකින් ය. සියළු සංකල්ප සම්මුති වෙයි. ඒ අපේ නිර්මාණ වෙයි. සත්වයකු නැතැයි යන්නට දෙන අනෙක් පිළිතුර නම් පංචස්කන්ධය හැරෙන්නට වෙනත් සත්වයකු නැති බව ය. අප තේරුම් ගත යුත්තක් නම් පංචස්කන්ධය යන්න ද සම්මුතියක් මිස පරමාර්ථයක් නොවන බව ය. ඒ කෙසේ වුවත් පංචස්කන්ධය ඔස්සේ කර්මඵලය තේරුම් ගන්නේ කෙසේ ද?

© Prof. Nalin De Silva

පුද්ගලයකුට මතකයක් ඇත්තේ කෙසේ ද? අපට, අප ලෙස, පුද්ගලයන් ලෙස, සත්වයන් ලෙස සිතන්නට ඉවහල්වන ප්‍රධාන ම කරුණක් නම් මතකය යැයි සිතිය හැකි ය. මතකය යන්න ද සම්මුතියක් පමණකි. මතකය ඇතිවන්නේ කෙසේ ද? ඒ පිළිබඳ විස්තරයක් කිරීමට පෙර අදාළ ප්‍රශ්න දෙකක් නැගිය යුතුව ඇත. මතකයක් නැති සත්වයන් සිටිය හැකි ද? මතකයක් ඇති සත්වයන් නොවන්නන් පැවතිය හැකි ද? මේ ප්‍රශ්නවලට පිළිතුරු දිය හැකි එක් මගක් නම් මතකයක් ඇත්තේ සත්වයන්ට පමණක් යැයි කීම ය. එසේ නම් පරිගණකය ගැන කිව හැක්කේ කුමක් ද? එහි දත්තාලයක් (දත්ත ගබඩාවක්) ඇත. එහෙත් දත්ත තිබූ පමණින් පරිගණකයට මතකයක් වේ ද? අපි පරිගණකයෙහි මතකය (මෙමරි) ගැන කතා කරමු. පරිගණකයෙහි දත්ත තිබූ පමණින් පරිගණකයට මතකයක් පිළිබඳ හැඟීමක් වේ ද? පුස්තකාලයක වාර්තා ඇත. අපට අවශ්‍ය නම් පුස්තකාලයේ මතකය ගැන කතා කළ හැකි ය. එහෙත් පුස්තකාලයට වාර්තා පිළිබඳ හැඟීමක් නැත. වාර්තා, දත්ත තිබූ පමණින් මතකයක් ඇති නොවේ. මතකයක් ඇති වීමට ඒ පිළිබඳ හැඟීමක්, විඥානයක් තිබිය යුතු ය.

පුස්තකාලය හා පරිගණකය මතකය සඳහා එතරම් හොඳ උදාහරණ නොවේ. අපි පොතක් හෝ පොල් ගෙඩියක් හෝ ගනිමු. පොත කල් යෑමේ දී දිරයි. පොල් ගෙඩිය ටික කලකින් නරක් වෙයි. එසේ වන්නේ කෙසේ ද? බාහිර බලවේගවලට හසු වීම නිසා එසේ වන්නේ යැයි කිසිවකු කියනු ඇත. බාහිර බලවේග පාලනය කළහොත් පොල් ගෙඩිය නරක් නොවී තබා ගත හැකි ද? එසේ තබා ගත හැකි නම් එහි අභ්‍යන්තර අණු පරමාණු ආදිය ගැන කිව හැක්කේ කුමක් ද? මේ පරමාණු නිත්‍ය නොවේ. පරමාණු වෙනස් වෙයි. බාහිර බලයක් නොයෙදෙව්ව ද පරමාණුවක් නිශ්චලව නොපවතියි. එහි ඉලෙක්ට්‍රෝන නිතරම චලනය වෙයි. දිගින් දිගට ම චලනය වන්නේ එකම ඉලෙක්ට්‍රෝන ද? එසේ නම් ඉලෙක්ට්‍රෝන නිත්‍ය ද? ඒවාට ආත්ම (වෙනස් නොවන්නක් යන අරුතින්, සත්වයන් ගැන මෙන් ම ධර්ම ගැන ද ආත්ම සංකල්පය යෙදෙයි. ) තිබේ ද? ඉලෙක්ට්‍රෝනයකට මතකයක් තිබේ ද? ඉලෙක්ට්‍රෝනයක් වෙනත් අංශුවක් හෝ වෙනත් යමක් (ක්ෂෙත්‍රයක්) හෝ සමග අන්තර්ක්‍රියාවක් නොසිදු වුවහොත් එය දිගට ම පවතින්නේ එහි කලින් අවස්ථා මත පදනම් වෙමිනි. එනම් ඉලෙක්ට්‍රෝනයේ වර්තමානයට එහි අතීතය බලපායි. ඉලෙක්ට්‍රෝනයට පමණක් නොව පෘථිවිය වැනි වෙනත් ඕනෑම වස්තුවකට ද එය එසේම ය. පසුගිය වසරේ ඔක්තෝම්බර් 20 වැනි දා පෘථිවියේ පිහිටීම අද එහි පිහිටීමට බලපායි. පෘථිවිය පසුගිය වසරේ වෙනත් ස්ථානයක පිහිටියේ නම් අද එය පිහිටන තැන නොව වෙනත් තැනක පිහිටනු ඇත. ඉලෙක්ට්‍රෝනය පෘථිවිය ආදිය යම් ආකාරයකට තම අතීතය යම් ප්‍රමාණයකට ගබඩා කර ගෙන ඇතැයි සිතිය හැකි ය.

ඉලෙක්ට්‍රෝනය, පොල් ගෙඩිය, පෘථිවිය, ආණ්ඩුව ආදිය තම තමන්ගේ අතීත යම් ප්‍රමාණයකට ගබඩා කර ගෙන ඇතත් ඒ ඒ දැයට තම අතීත ගැන විඥානයක් නැත. මේ එකක්වත් සත්වයෙක් නොවේ. (ආණ්ඩුවේ සත්වයන් සිටිය ද ආණ්ඩුව සත්වයෙක් නොවේ.) සත්වයන් අතීත ගබඩා කර ගෙන ඇතිවා පමණක් නොව ඔවුන්ට අතීතය පිළිබඳ විඥානයක් ද ඇත. සත්වයාගේ නාම රූප (පංචස්කන්ධය) වැදගත් වන්නේ මෙහි දී ය. වේදනා, සංඥා, සංඛාර, විඥාන වශයෙන් නාමය දැක්වෙයි. යම් අතීතයක් ගබඩා වී තිබුණ ද, වේදනා, සංඥා, සංඛාර හා විඥාන ඉලෙක්ට්‍රෝන ආදියට නැත. සත්වයන් සම්බන්ධයෙන් ගත් කල ඒවා තිබෙනු පමණක් නොව එකක් අනෙකෙන් වෙන් නොවී පවතියි.

මනස යන ආකෘතිය ගොඩ නැගෙන්නේ ද මනසට සාපේක්ෂව ය. එය මනසින් කෙරෙන්නකි. අපට ඉන් ගැලවිය නොහැකි ය. මේ වාස්තවික ආකෘතියක් නොවේ. මෙහි ඇත්තේ චක්‍රීය භාවයකි. ඒ අපේ චින්තනයේ ලක්ෂණයකි. චිත්ත, චෛතසික, රූප, නිවන පරමාර්ථ ධර්ම යැයි අභිධර්මයෙහි සඳහන් වෙයි. චිත්ත, චෛතසික, රූප පරමාර්ථ වන්නේ ඒ මනසට සංස්කරණය කර ගත හැකි " කුඩා ම " ධර්ම යන තේරුමෙන් යැයි කිව හැකි ය. බෝධි හිමියන් ඉංගිරිසියට පරිවර්තනය කර ඇති අභිධර්මාර්ථ සංග්‍රහයට උන්වහන්සේ ලියා ඇති හැඳින්වීමෙහි මේ ධර්ම තුන මනස අත්දකින ධර්ම ලෙස දක්වා ඇත. මේ ඊනියා වාස්තවික යථාර්ථයක වූ ධර්ම නොවේ. බෝධි හිමියන් ඒ විස්තර කරන්නේ අත්දකින "වේදයිත" යථාර්ථයක් ලෙස ය. එහිමියන් එසේ නොකීව ද, මේ ධර්ම තුන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අනවබෝධයෙන් මනස නිර්මාණය කරන, සංස්කරණය කරන මනසට සාපේක්ෂ ධර්ම තුනක් වෙයි. (මනසෙහි සංස්කරණ මගේ ලෝකයෙහි විස්තර වේ.) මේ ධර්ම "පවතින්නේ" ඉතා කෙටි කාලයක් තුළ ය. ධර්මයක් ඇති වී, පැවතී, නැති වීම හා ක්ෂණවාදය සම්බන්ධ වෙයි. ධර්මයක් ඇති වී පැවතී නැති වන්නේ යැයි ව්‍යවහාර කළ ද අවසාන විග්‍රහයෙහි දී එය ද නිවැරදි නොවේ. ධර්මයක් ක්ෂණයකට හෝ පවතින්නේ යැයි කී විට එහි ආත්මවාදයක්

© Prof. Nalin De Silva

වෙයි. ධර්ම ද වෙනස්වන දෑ ලෙස ගැනෙන්නේ එබැවිනි. නිවන මෙන් ම අනිත්‍ය හා අනාත්ම ද වචනයෙන් විස්තර කළ නොහැකි ය. ආලය විඥානය මෙන් ම ක්‍ෂණවාදය ද, අනිත්‍ය අනාත්ම වචනයෙන් විස්තර කිරීමට ගොස් තනා ගත් ආකෘතියක් වෙයි. ආලය විඥාන ආකෘතිය සංතතික වන අතර ක්‍ෂණවාද ධර්මවාද ආකෘතිය අසංතතික වෙයි. සෞත්‍රාන්තිකයන්ගේ පැවැත්මක් නොමැතිව ධර්මයක් ඇති වී නැති වීම ආත්මවාදය පිටු දකින නමුත් මුළු ලෝකයම එකම මොහොතකට සංකේන්ද්‍රණය කරයි. එකම මොහොතෙහි සියළු ධර්ම ඇති වී නැති වෙයි. ඒ සමග ලෝකය ද නැති වෙයි. මනසට හෝ සාපේක්‍ෂව ලෝකයක් නොමැති නම් තේරුම් ගන්නේ අභවල් එක ද? ලෝකයක් නැත්නම් ධර්ම ද නැත! සෞත්‍රාන්තිකයන් ද නැත!

අනිත්‍ය හා අනාත්ම සංතතික හෝ අසංතතික හෝ නොවෙයි. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි මනස පිළිබඳ ප්‍රවාදය ඉදිරිපත් කෙරෙන්නේ ධර්මවාද ආකෘතිය යොදා ගනිමිනි. නැති (භංග) වන්නේ ඇති වූ (ඉපදුණු) චිත්තය නොවේ. චිත්ත ද වෙනස් වෙයි. එහෙත් අපට චිත්තය තව තවත් කොටස්වලට කැඩීමෙන් මේ ඇතිවන නැතිවන වෙනස්වන ප්‍රශ්නයට පිළිතුරක් ලබා ගත නොහැකි ය. මනසට ග්‍රහණය කර ගත හැකි සීමාවේ චිත්ත, චෛතසික හා රූප වෙයි. පරමාණු, මූලික අංශු, ක්වාක්, තන්තු ආදී වශයෙන් ද්‍රව්‍ය කොටස්වලට කැඩීමේ ද සීමාවක් තිබිය නොහැකි ය. එහෙත් එහි ද මනසට ග්‍රහණය කර ගත හැකි සීමාවක් වෙයි. බටහිර භෞතික විද්‍යාඥයෝ ඒ සීමාවට ළඟාවෙමින් සිටිති. බුදුන් වහන්සේ සංයුත්ත නිකායෙහි මෙන් ම අංගුත්තර නිකායෙහි ද මනස එකක් ලෙස ඉපිද වෙනෙකක් ලෙස භංග වන බව දේශනා කර ඇති බව වයි. ඩබ්. කරුණාදාස මහතා බුඩිස්ට් ඇනැලිසිස් ඔෆ් මැටර් කෘතියෙහි සඳහන් කරයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva